# කෝට්ටේ යුගයේ සාහිත්‍ය තුළින් හෙළිවන දේශපාලන තත්ත්වය පිළිබඳ විමර්ශනයක්

එස්.පී.එස්.එම්. කුමාරි.
විශේෂවේදී දෙවන වසර.
ඉතිහාසය අධ්‍යයන අංශය
spsmadushaani@gmail.com

**සංක්ෂේපය**

ලංකා ඉතිහාසයේ අවසන් කීර්තිමත් රාජ්‍යය ලෙස කෝට්ටේ හැඳින්විය හැකි අතර අලගක්කෝනාර විසින් බලකොටුවක් ලෙස මෙය ගොඩනගන ලදුව හයවන පරාක්‍රමබාහු එය ස්වකීය අග්‍ර රාජධානිය බවට පත් කරගනු ලැබීය. ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් රාජධානියක් වශයෙන් කෝට්ටේ හැඳින්විය හැකිය. මේ යුගයේ දේශපාලන තොරතුරු රැසක් මෙකල ලිය වී ඇති සාහිත්‍ය කෘති තුළින් හෙළිවේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කෝට්ටේ යුගයේ සාහිත්‍යය තුළින් දේශපාලන තත්ත්වය පිළිබඳ හෙළිවන්නේ ද යන්න විමර්ශනය කිරීමයි. ප්‍රධාන ලෙස ප්‍රාථමික මූලාශ්‍රය මෙන්ම ද්විතීය මූලාශ්‍රය ද මෙහිදී ක්‍රමවේදය ලෙස භාවිතා කෙරිණි.

කෝට්ටේ යුගයේ පාලන බලයට පත් පාලකයන් පිළිබඳව සහ ඔවුන් අනුගමනය කළ පාලන ප්‍රතිපත්තීන් පිළිබඳව විමර්ශනය කිරීමේදී කෝට්ටේ යුගය තුළ රචනා වූ කෘතීන් සඳහා ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. දේශපාලන වශයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමේදී හයවන පරාක්‍රමබාහු හට මූලික ස්ථානයක් ලැබී තිබේ. හයවන පරාක්‍රමබාහු රජුගේ යාපන රාජ්‍යය ජයග්‍රහණය, අදිවීරරාම නම් දකුණු ඉන්දීය තොටුපල ජයග්‍රහණය කිරීම ගැන තොරතුරු හෙළිකරගත හැකිය. දේශපාලනික වශයෙන් මෙකල පාලනය කළ ප්‍රාදේශීය පාලකයන් පිළිබඳව සහ හයවන පරාක්‍රමබාහුගෙන් පසුව බලයට පත් පාලකයන් වූ ජයබාහු හයවන බුවනෙකබාහු අටවන වීර පරාක්‍රමබාහු වැනි පාලකයන් පිළිබඳව හා ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු මෙකල රචනා වූ කෘති තුළින් හෙළි වේ. කෝට්ටේ යුගයේ රචනා වූ සාහිත්‍යය කෘතීන් තුළින් එකල පැවති දේශපාලන තත්ත්වය පිළිබඳව තොරතුරු හෙළිවන බව මූලාශ්‍රය අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකි විය.

**ප්‍රමුඛ පද - සාහිත්‍යය, ආගමික, සන්දේශ, දේශපාලන, හයවන පරාක්‍රමබාහු**